# 6

# භෞමික ක්ෂීරපායින්

ආචාර්ය දේවක වීරකෝන් සහ සම්පත් ගුනතිලක
සත්ත්ව විද්‍යා අධ්‍යයනාංශය,
කොළඹ විශ්ව විද්‍යාලය, කොළඹ.

## හැඳින්වීම:

ක්ෂීරපායින් යනු ඔවුන්ටම ආවේණික වු ලක්ෂණ ගනනාවක් දරන අචලතාපී පෘෂ්ඨවංශි කාන්ඩයකි. ක්ෂිරපායි යන වචනයේ අර්ථය වන්නේ පැටවුන් කිරිවලින් පෝෂණය කරන ජීවීන් යන්නයි. මේ සඳහා සියලුම ක්ෂිරපායින් උදරීයව පිහිටි ස්ථන ග්‍රන්ථි දරයි. දේහය රෝමවලින් වැසී තිබීම තවත් සුවිශේෂ ක්ෂිරපායි ලක්ෂණයකි. රෝම දේහ තාපය යාමනය කර ගැනීම සඳහා ක්ෂිරපායින් දක්වන අනුවර්තනයකි. නමුත් සමහර ක්ෂිරපායින්ගේ රෝම ද්විතීයිකව අවශේෂව ගොස් ඇත. මෙය පිහිනීමේදී ඇතිවන ප්‍රතිරෝධය අවම කර ගැනීම සඳහා ජලජ ක්ෂිරපායින් දක්වන අනුවර්තනයකි. තවද ක්ෂිරපායින් ගේ සමෙහි ප්‍රධාන ග්‍රන්ථි දෙවර්ගයක් දැකගත හැක. එනම් ශ්වේතය ග්‍රන්ථි සහ ස්නේහස්‍රාවී ග්‍රන්ථිය. ශ්වේත ග්‍රන්ථි මගින් ශ්‍රාවය කරනු ලබන ශ්වේත දේහ තාපය යාමනය කර ගැනීමටද ස්නේහස්‍රාවී ග්‍රන්ථි වල ශ්‍රාවයන් රෝම ස්නේහනය කර ආරක්ෂා කර ගැනීමටද ඉවහල් වේ. ක්ෂිරපායින්ගේ හනුව තනි අස්ථියකින් (දන්තාස්ථිය) සමන්විත වේ. ඔවුන් විෂමදන්ති ජීවීන් වන අතර කෘන්තක, රදනක, පුරශ්චාර්වක සහ චාර්වක වශයෙන් දත් වර්ග හතරක් දරයි. නමුත් සමහර ක්ෂිරපායින්ගේ දැකගත හැක්කේ මින් එක් වර්ගයක් හෝ වර්ග කීපයක් පමණක් වන අතර (උදා: අලියා දරන්නේ චාර්වක දත් පමණක් වන අතර ඇතුන් ගේ දළ වශයෙන් පිහිටා ඇත්තේ විශාලනය වු කෘන්තක දත් දෙකකි) සමහරුන්ගේ දත් සියල්ලම ක්ෂිණ වී ගොස් ඇත (උදා: කබල්ලෑවා). තවද ක්ෂිරපායින්ගේ ජීවිතයේ මුල් අවධියේ කිරි දත් සහ පසු කාලීනව ස්ථිර දත් වශයෙන් දත් පෙලවල් දෙකක් පමණක් දරයි (ද්විවාර දන්තීය). භෞමික ක්ෂිරපායින් ග්‍රාතා යුගල දෙකක් දරන අතර ඇඟිලි තුඩුවල නිය, නබර හෝ කුර දරයි. මොවුන්ගේ දේහ කුහරය පේශිමය ප්‍රාචීරය මගින් උරස් සහ උදර කුහරවලට වෙන්වී පවතී. මොවුන්ගේ සංසරන පද්ධතියෙහි දැකගත හැක්කේ වම් සංස්ථානික චක්‍රය පමණි. මොවුන් ග්‍රෛව කශේරුකා හතක් (7) පමණක් දරන අතර කශේරුකා දේහය නිරාවතල තත්වය පෙන්නුම් කරයි. ක්ෂිරපායින් මුලින්ම පරිනාමය වුයේ මීට වසර මිලියන 220 කට පමණ පෙර විසූ උරග පුර්වජයෙකුගෙන් බව විශ්වාස කෙරේ. වර්තමාන පෘථුවිය මත ක්ෂිරපායි විශේෂ 4500 ක් පමණ වෙසෙන බව අනුමාන කෙරේ. මේ සියලුම ක්ෂිරපායින් අයත් වන්නේ මැමේලියා (mammalia) වර්ගයටය. මෙම වර්ගය තව දුරටත් මොනොට්‍රිමාටා (monotremata), මාසුපියාලිය (Marsupialia) සහ ඉයුතෙරියා (Eutheria) වශයෙන් උප වර්ග තුනකට බෙදා දැක්විය හැකිය. ශ්‍රී ලංකාවේ දැකගත හැක්කේ මින් ඉයුතෙරියා උප වර්ගයට අයත් ක්ෂිරපායින් පමණි.

## ශ්‍රී ලංකාවේ වෙසෙන ක්ෂිරපායි විශේෂ:

ශ්‍රී ලංකාවේ වත්මන් ලේඛන වලට අනුව ක්ෂිරපායි විශේෂ 130 දැකගත හැකිය.

| ගෝත්‍රය | කුල ගණන | එකතුව | | ආවේණික | | හඳුන්වාදුන් | |
|---|---|---|---|---|---|---|---|
| | | සන | විශේෂ | සන | විශේෂ | සන | විශේෂ |
| Pholidota | 1 | 1 | 1 | - | - | - | - |
| Insectivora | 1 | 4 | 9 | 1 | 4 | - | - |
| Chiroptera | 7 | 15 | 30 | - | - | - | - |
| Primates | 2 | 4 | 5 | - | 3 | - | - |
| Carnivora | 6 | 9 | 14 | - | 1 | 2 | 2 |
| Proboscidea | 1 | 1 | 1 | - | - | - | - |
| Perrisodactyla | 1 | - | - | - | - | 1 | 2 |
| Artiodactyla | 4 | 6 | 8 | - | 2 | 5 | 6 |
| Rodentia | 4 | 14 | 22 | 1 | 6 | 1 | 1 |
| Lagomorpha | 1 | 1 | 1 | - | - | 1 | 1 |
| **එකතුව** | **28** | **55** | **91** | **2** | **16** | **10** | **12** |
| Cetacea | 5 | 19 | 26 | - | - | - | - |
| Sirenia | 1 | 1 | 1 | - | - | - | - |
| **එකතුව** | **6** | **20** | **27** | **-** | **-** | **-** | **-** |

*වගුව 1: ශ්‍රී ලංකාවේ භෞමික සහ ජලජ ක්ෂීරපායී විශේෂ*

මින් විශේෂ 103 ක් භෞමික පරිසරයේ ජීවත් වන අතර ඉතිරි විශේෂ 27 සමුද්‍ර වාසීන් වේ. භෞමික විශේෂ 103 න් විශේෂ 12 ශ්‍රී ලංකාවට මිනිසා විසින් හඳුන්වා දෙන ලද ක්ෂිරපායින් වේ.

| විද්‍යාත්මක නාමය | ඉංග්‍රීසි නාමය | සිංහල නාමය |
|---|---|---|
| *Canis familiaris* | Domestic dog | බල්ලා |
| *Felis catus* | Domestic cat | බළලා |
| *Bos indicus* | Domestic hump backed cattle | බටු හරකා |
| *Bos Taurus* | European cattle | එල හරකා |
| *Bubalus bubalis* | Domestic water buffalo | මී හරකා |
| *Capra hircus* | Domestic goat | එළුවා |
| *Ovis aries* | Domestic sheep | බැටළුවා |
| *Sus domesticus* | Domestic pig | ගං ඌරා |
| *Equus asinus* | Donkey | බූරුවා |
| *Equus caballus* | Mannar pony | පෝනියා |
| *Rattus norvegicus* | Brown rat | බොර මීයා |
| *Oryctolagus cuniculus* | Domestic rabbit | රට හාවා |

*වගුව 2: ශ්‍රී ලංකාවට හඳුන්වාදෙන ලද ක්ෂීරපායී විශේෂ*

ඉතිරි විශේෂ 91 න් විශේෂ 16 ක් ශ්‍රී ලංකාවට ආවේණික වූ ජීවී විශේෂ වේ

| විද්‍යාත්මක නාමය | ඉංග්‍රීසි නාමය | සිංහල නාමය |
|---|---|---|
| *Macaca sinica* | Sri Lanka toque monkey | ශ්‍රී ලංකා රිලවා |
| *Trachypithecus vetulus* | Purple-faced leaf monkey | ශ්‍රී ලංකා කලු වඳුරා |
| *Loris tardigradus* | Sri Lanka red slender loris | ශ්‍රී ලංකා රත් උනහපුලුවා |
| *Crocidura miya* | Sri Lanka long-tailed shrew | ශ්‍රී ලංකා කුනු හික් මීයා |
| *Solisorex pearsoni* | Pearson's long-clawed shrew | ශ්‍රී ලංකා මහ හික් මීයා |
| *Suncus fellowesgordoni* | Sri Lanka pygmy shrew | ශ්‍රී ලංකා පොඩි හික් මීයා |
| *Suncus zeylanicus* | Sri Lanka jungle shrew | ශ්‍රී ලංකා කැලෑ හික් මීයා |
| *Paradoxurus zeylonensis* | Sri Lanka golden palm cat | ශ්‍රී ලංකා රත් කලවැද්දා |
| *Moschiola meminna* | Sri Lanka mouse deer | ශ්‍රී ලංකා මීමින්නා |
| *Moschiola kathygre* | Sri Lanka pygmy mouse deer | ශ්‍රී ලංකා කුරු මීමින්නා |
| *Funambulus layardi* | Sri Lanka flame striped jungle squirrel | ශ්‍රී ලංකා මූකලන් ලේනා |
| *Mus fernandoni* | Sri Lanka spiny mouse | ශ්‍රී ලංකා කටු හික් මීයා |
| *Mus mayori* | Sri Lanka spiny rat | ශ්‍රී ලංකා කටු හික් මීයා |
| *Srilnkamys ohiensis* | Sri Lanka bi-colored rat | ශ්‍රී ලංකා දෙපැහැ මීයා |
| *Rattus montanus* | Nillu rat | ශ්‍රී ලංකා නෙලු මීයා |
| *Vandeleuria nolthenii* | Sri Lanka long tailed tree mouse | ශ්‍රී ලංකා ගස් මීයා |

වගුව 3: ශ්‍රී ලංකාවට ආවේණික ක්ෂීරපායී විශේෂ

මීට අමතරව ශ්‍රී ලංකාවේ වඳවී ගිය ක්ෂිරපායි විශේෂ 21ක් වාර්තා වේ. මින් විශේෂ 4 මයෝසීන යුගයෙන්ද විශේෂ 17 ප්ලයිස්ටොසීන් යුගයෙන්ද වාර්තාවේ. මයොසීන් යුගයෙන් වර්තාවන ක්ෂිරපායින් විශේෂ 4 ම සමුද්‍රවාසීන්ය. ප්ලයිස්ටොසීන් යුගයෙන් වාර්තාවන සියලු විශේෂ භෞමික ජීවීන් වන අතර මෙයට අලි විශේෂ 2ක්, හිපපොටේමස් විශේෂයක්, ව්‍යාඝ්‍ර විශේෂයක්, සිංහ විශේෂයක්, සුනඛ විශේෂයක් ඇතුලුව විශේෂ 17 ක් අයත් වේ. ශ්‍රී ලංකාවෙන් වාර්තාවන ක්ෂිරපායි විශේෂ 130 න් විශේෂ 22 තර්ජනයට ලක්වූ ජීවී විශේෂ ලෙස IUCN අන්තර් ජාතික සංරක්ෂණ සංගමය විසින් වර්ෂ 2004 දී පල කල රතු ලැයිස්තුවෙහි සඳහන් වේ.

| විද්‍යාත්මක නාමය | ඉංග්‍රීසි නාමය | සිංහල නාමය | ස.ත. |
|---|---|---|---|
| *Balaenoptera musculus* | Blue whale | නිල් තල්මසා | EN |
| *Balaenoptera physalus* | Fin whale | වරල් තල්මසා | EN |
| *Megaptera novaeangliae* | Humpback whale | මොල්ලි තල්මසා | VU |
| *Physeter macrocephalus* | Sperm whale | මුහුදු ඌරා | VU |
| *Dugong dugon* | Dugong, Sea cow | මන්ද තල්මසා | VU |
| *Macaca sinica* | Sri Lanka toque monkey | ශ්‍රී ලංකා රිලවා | VU |
| *Trachypithecus vetulus* | Purple-faced leaf monkey | ශ්‍රී ලංකා කලු වඳුරා | EN |

| විද්‍යාත්මක නාමය | ඉංග්‍රීසි නාමය | සිංහල නාමය | ස.ත. |
|---|---|---|---|
| *Elephas maximus* | Asian elephant | ආසියානු අලියා | EN |
| *Prionailurus rubiginosus* | Rusty-spotted cat | කොල දිවියා | VU |
| *Prionailurus viverrinus* | Fishing cat | හදුන් දිවියා | VU |
| *Loris tardigradus* | Sri Lanka red slender loris | ශ්‍රී ලංකා රන් උනහපුලුවා | EN |
| *Crocidura miya* | Sri Lanka long-tailed shrew | ශ්‍රී ලංකා කුනු හික් මීයා | EN |
| *Feroculus feroculus* | Kelaart’s long-clawed shrew | පිරි හික් මීයා | EN |
| *Melursus ursinus* | Sloth bear | වලහා | VU |
| *Rattus montanus* | Nillu rat | ශ්‍රී ලංකා නෙලු මීයා | CR |
| *Ratufa macroura* | Grizzled giant squirrel | දඬු ලේනා | VU |
| *Solisorex pearsoni* | Pearson’s long-clawed shrew | ශ්‍රී ලංකා මහ හික් මීයා | EN |
| *Suncus fellowesgordoni* | Sri Lanka pygmy shrew | ශ්‍රී ලංකා පොඩි හික් මීයා | EN |
| *Suncus montanus* | Highland shrew | කදු හික් මීයා | VU |
| *Suncus zeylanicus* | Sri Lanka jungle shrew | ශ්‍රී ලංකා කැලෑ හික් මීයා | EN |
| *Vandeleuria nolthenii* | Sri Lanka long tailed tree mouse | ශ්‍රී ලංකා ගස් මීයා | VU |

*සංරක්ෂණ තත්වය (ස.ත.): CR - දැඩි ලෙස අන්තරායකර, EN - අන්තරායකර, VU - අවදානම්*

*වගුව 4: ශ්‍රී ලංකාවේ තර්ජනයට ලක් වූ ක්ෂීරපායී විශේෂ*

## ශ්‍රී ලංකාවේ ක්ෂිරපායින්ගේ ව්‍යාප්තිය:

ශ්‍රී ලංකාවේ වෙසෙන භෞමික ක්ෂිරපායි විශේෂ 91 න් විශේෂ 16 ක් ශ්‍රී ලංකාවට ආවේණික වන අතර ඉතිරි විශේෂ 75 ශ්‍රී ලංකාවට දේශීය වූ විශේෂ ලෙස සැලකේ. මින් විශේෂ 5 ක් දකුණු ආසියාව පුරාම ප්‍රචලිත වී ඇති අතර විශේෂ 70 ක් ඉන්දියානු උප මහද්වීපයට සීමාවී ඇත. මෙම විශේෂ 70 න් විශේෂ 23 ක් දැකගත හැක්කේ ශ්‍රී ලංකාවේ සහ ඉන්දියාවේ පමණි. ඉතිරි විශේෂ 43 සලකා බලන කල ඉන්දියාව සහ ශ්‍රී ලංකාව හැරුණු කොට විශේෂ 12 ක් පාකිස්ථානයේ පමණක්ද, විශේෂ 7 ක් නේපාලයේ පමණක්ද, විශේෂ 4 ක් බංග්ලාදේශයේ පමණක්ද දැකගත හැකිය.

ශ්‍රී ලංකාව තුල ක්ෂිරපායි විශේෂවල ව්‍යාප්තිය සලකා බැලු කල විශේෂ 22 ක් ශ්‍රී ලංකාව පුරාම ව්‍යාප්ත වී ඇති අතර විශේෂ 13 ක් කඳුකර සහ අතර මැදි කලාපය හැර අනෙක් සියලුම ප්‍රදේශවල දැකගත හැකිය. විශේෂ 6 ක් තෙත් කලාපයට පමණක් සීමාවී ඇති අතර විශේෂ 6 ක් කඳුකර කලාපයට පමණක් සීමාවී ඇත. ශ්‍රී ලංකාවට ආවේණිකවූ විශේෂ 16 න් 9 ක්ම තෙත් කලාපයට පමණක් සීමාවී තිබීම ද තවත් සුවිශේෂ ලක්ෂණයකි. ආවේණික විශේෂ 7 ක් වඩාත් පුළුල් ව්‍යාප්තියක් දක්වයි.

## ශ්‍රී ලංකාවේ ක්ෂිරපායින්ට ඇති තර්ජන සහ සංරක්ෂණ අවශ්‍යතා:

ශ්‍රී ලංකාවේ ක්ෂිරපායින්ට එල්ලවී ඇති ප්‍රධානතම තර්ජනය ලෙස ඔවුන්ගේ වාසස්ථානවල ප්‍රමානාත්මක අඩුවීම සඳහන් කල හැකිය. විශේෂයෙන්ම තෙත් කලාපයේ ඇති ස්වාභාවික වාසස්ථාන ඉතා සීඝ්‍රයෙන් විනාශ වී යන අතර ඉතිරි වී තිබෙන වාසස්ථානද කැබලිකරනයට ලක්වී ඇති බව මෑතකදී කරන ලද සමීක්ෂණවලින් පෙනී යයි. නමුත් ශ්‍රී ලංකාවේ ක්ෂිරපායින්ගෙන් (විශේෂයෙන්ම ශ්‍රී ලංකාවට ආවේණික විශේෂ) 90% කටත් වඩා තෙත් කලාපයේ වෙසෙන අතර විශේෂ ගණනාවක් තෙත් කලාපයට පමණක් සීමාවී ඇත. එබැවින් තෙත් කලාපයේ සිදුවන මෙම වාසස්ථානවල පරිහානිය මෙම ජීවීන්ට තදින් ම බලපානු ඇත. එබැවින් ශ්‍රී ලංකාවේ ක්ෂිරපායින් සංරක්ෂණය සඳහා තෙත් කලාපයේ ඉතිරිව ඇති ස්වාභාවික වාසස්ථානවලින් හැකි තරමක් සංරක්ෂණය කිරීමට සහ සංරක්ෂණ හිතකාමි භූමි පරිහරණයට ලක් කිරීම ඉතා වැදගත්ය.

ශ්‍රී ලංකාවේ ක්ෂිරපායින් හට එල්ලවී ඇති තවත් තර්ජනයක් වන්නේ සතුන් දඩයම් කිරීමය. විවිධ හේතූන් නිසා ක්ෂිරපායින් දඩයම් කරනු ලැබේ. ආහාර සඳහා දඩයම් කිරීම (උදා: මුවාල ගෝනාල වල් ඌරා යනාදීන්) සම සඳහා දඩයම් කිරීම (උදා: දිවියා) වගා හානි කිරීම නිසා දඩයම් කිරීම (උදා: අලියා, දඬු ලේනා, වඳුරන්, ඉත්තෑවා) ඉන් ප්‍රධාන හේතු වේ.

ශ්‍රී ලංකාව ක්ෂිරපායින්ගේ විශේෂ ඝනත්වය (වර්ග කිලෝ මීටර් 10,000 ක ඇති විශේෂ ගනන) මත සලකා බලන කල ආසියානු කලාපයේ ඉහල ම ස්ථානය ගනී. නමුත් මොවුන්ගේ බොහොමයක් වඳවීමේ තර්ජනයට මුහුණ දී ඇත. එබැවින් මෙම ජීවීන් සංරක්ෂණය කිරීම සඳහා අනාගතයේ දී අපට මහත් පරිශ්‍රමයක් දැරීමට සිදුවනු ඇත. එය සාර්ථක කරගත හැක්කේ සැලසුම් සහගත සංරක්ෂණ ක්‍රියාවලියක් තුල පමණි. මේ සඳහා අවශ්‍ය පසුබිම් ක්‍රියාවලි ගණනක් මේ වන විට පරිසර අමාත්‍යාංශයේ දායකත්වය යටතේ දියත් කොට ඇත. මෙම ක්‍රියාවලිය තුලින් ක්ෂිරපායින් මෙන් ම ශ්‍රී ලංකාවේ අනෙක් ජෛව විවිධත්වය ද සංරක්ෂණය කිරීම සඳහා අඩි තාලම වැටෙනු ඇතැයි යන්න සංරක්ෂණ හිතකාමී සැමගේ අපේක්ෂාවයි.